නීතිඥ දයාසිරි ජයසේකර
කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී
Dayasiri Jayasekara (LL.B) Attorney-at-law
Member of parliament - Kurunegala District

2025.10.07

ගරු කථානායකතුමා,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ.

ගරු කථානායකතුමනි,

**ස්ථාවර නියෝග 29 - 1 හා 2 යටතේ ඉදිරිපත් කරනු ලබන වරප්‍රසාද ප්‍රශ්නය.**

අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවේ වත්මන් අධ්‍යක්ෂ ජෙනරාල්වරයා තෝරා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් 2024.10.14 වන දින අයදුම්පත් කැඳවීමේ දැන්වීම නිකුත් කර ඇත. පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඉදිරිපත් වී ඇති අයදුම් පත්‍ර අතරින් නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිස්ටර් ජෙනරල් මාධව තෙන්නකෝන් මහතා සහ මහාධිකරණ විනිසුරු රංග දිසානායක මහතාගේ නම් තෝරාගෙන ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අපේක්ෂකයින් වෙත ලබා දී ඇති නිර්දේශ සලකා බැලීමේ දී උතුරු මැද පළාත් ආණ්ඩුකාර හිටපු මහාධිකරණ විනිසුරු වසන්ත කුමාර විමලසිරි ජිනදාස මහතාගේ සහ සබරගමුව පළාත් ආණ්ඩුකාර හිටපු මහාධිකරණ විනිසුරු චම්පා ජානකී රාජරත්න මහත්මියගේ නිර්දේශ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ දීර්ඝ වශයෙන් සාකච්ඡා කර අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් වන බැවින් ආණ්ඩුකාර තනතුර දේශපාලන පත්වීමක් හේතුවෙන් එම නිර්දේශ කිරීම දේශපාලන මැදිහත්වීමක් වන බව සලකා පස් දෙනෙක් මාධව තෙන්නකෝන් මහතා වෙනුවෙන් ද, හතර දෙනෙක් රංග දිසානායක මහතා වෙනුවෙන් ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඡන්දය ප්‍රකාශ කර ඇත.

පසුව ගරු සභානායක බිමල් රත්නායක මහතා විසින් පවසා ඇත්තේ අදාළ නිර්දේශ ලිපි ඉදිරිපත් කර ඇත්තේ ආණ්ඩුකාරවරුන් ලෙස පත්වීමට පෙර බැවින් එය දේශපාලනික ලිපි නොවන බව දැනුම්දීමෙන් අනතුරුව ඔහුගේ වචනය විශ්වාස කර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජික මහාචාර්ය දිනේෂා සමරරත්න මහත්මිය විසින් රංග දිසානායක මහතා වෙත සිය ඡන්දය භාවිතා කිරීම හේතුවෙන් ඔහු තෝරා ගෙන ඇත.

නමුත් ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ ගැසට් පත්‍රය 2024.09.27 වන දින ප්‍රසිද්ධ කර ඇති අතර ඔවුන් විසින් රංග දිසානායක මැතිතුමාගේ නම නිර්දේශ කර තිබෙන්නේ ආණ්ඩුකාරවරුන් ලෙස පත් වූ පසුව බව දැන ගැනීමෙන් පසු එදිනම මහාචාර්ය දිනේෂා සමරරත්න මහත්මිය විසින් ගරු කථානායකතුමන් වෙත දිවුරුම් ප්‍රකාශක් මගින් ඊමේල් පණිවිඩයක් හරහා සිය ඡන්දය භාවිතා කිරීමේ දී සිදු වූ තත්ත්වය පිළිබඳව ඇයගේ විරෝධය දක්වා තිබේ.

පාර්ලිමේන්තු බලතල හා වරප්‍රසාද පනතේ උපලේඛනය (අ) කොටසේ 4 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තු කාරක සභාවක රැවටීමේ අදහසින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම බලවත් වරදක් වන අතර එම වරද හිතාමතාම සභානායක ගරු බිමල් රත්නායක මහතා විසින් සිදු කර ඇති අත. එසේම ගරු කථානායකතුමන් ද අදාළ වරදම සිදු කර ඇති අතර එය මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ ප්‍රධානියා

කාර්යාලය "මහගෙදර" නව ක්‍රීඩාංගණය පාර, හෙට්ටිපොළ, ශ්‍රී ලංකාව + 94372291841
Email panduwasnuwara.slfp@gmail.com dayasirij@gmail.com
Office "Mahagedara" New Playground Rd, Hettipola, Sri Lanka + 94372291841

ලෙසත් සභානායක වරයා ලෙසත් ඔවුන් දෙදෙනාම සමස්ථ පාර්ලිමේන්තුවේ ගෞරවයට බලවත් හානියක් සිදු කර ඇත.

එම තත්ත්වය මත සමස්ථ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වී ඇති බැවින් ඒ පිළිබඳව වරපසාද කමිටුව වෙත මෙය ඉදිරිපත් කරන ලෙසත්, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙස මෙම සිදුව ඇති බරපතල කාරණය පිළිබඳව ගරු කථානායකතුමාගේ පැහැදිලි කිරීමක් මෙම ගරු සභාවට ලබා දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,

නීතිඥ දයාසිරි ජයසේකර
කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී

නීතිඥ දයාසිරි ජයසේකර
කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී